බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

2017 මැයි මස 23 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුද හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළා පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයු ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙ

2017.04.25 දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/vi(1)/17/39

---

අ. බේරුවල ප්‍රාදේශීය සභාවේ පරිගණක පුහුණු මධ්‍යස්ථානය සඳහා 2015, 201 වර්ෂවල පාඨමාලා හැදෑරූ සිසුන් ගණන කොපමණද?

ආ. පාඨමාලා ගණන කීයද?

ඇ. ඔවුන්ගෙන් ලබාගත් මුදල් ප්‍රමාණය කොපමණද?

ඈ. ඒවා ලබා ගෙන පරිගණක මධ්‍යස්ථානයට සලසා දුන් සේවාවන් මොනවාද?

ඉ. 2017 වර්ෂයට බඳවාගත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

ඊ. පාඨමාලා සඳහා එම දරුවන්ට අදාල පොත් කට්ටල සියල්ල ලබා දී තිබේද?

උ. දැනට අධ්‍යයන කටයුතු කරන ක්‍රමවේදය කුමක්ද?

ඌ. ගුරුවරියට ලබා දී ඇති සහායිකාවට පරිගණක සම්බන්ධ දැනුමක් තිබේද?

එ. 2014, 2015, 2016, 2017 වර්ෂවල පරිගණක පුහුණු මධ්‍යස්ථානය භාරව සිටි නිළධාරියා හෝ නිළධාරිනිය කවුද?

ඒ. මෙහි වත්කම් භාරව සිටින්නේ කවුද?

ඔ. මෙය 2014 සිට 2016 දක්වා අධීක්ෂණය කළ නිළධාරියා කවුද?

**2.** ගරු නන්දන පද්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.04.25 දින අසන ලද ප්‍රශ්නය,' (පු/vi(1)/17/41)

(අ)(i) හොරණ නගර සභාව මගින් 2014 වර්ෂයේ නගර සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම හා නාගරික කාන්තාවන්ගේ ජීවන තත්වය ඉහල නැංවීම වෙනුවෙන් ක්‍රියාත්මක කල ව්‍යාපෘති මොනවාද?

(ii) ඒ සඳහා වියදම් කළ මුළු මුදල කොපමණද?

(iii) ව්‍යාපෘතිය, ව්‍යාපෘති වාර්ථාව, වියදම්කල මුදල, වෙන් වෙන් වශයෙන් කවරේද?

(iv) එය සහාගත කාරන්නේද?

(ආ) ඉහත ව්‍යාපෘතිය යටතේ නගර සීමාව තුල කිරි අලෙවිසැල් ඉදිකලේද?

(i) ඉදිකල කිරි අලෙවිසැල් ප්‍රමාණය කොපමණද?

(ii) ඒ කුමන ස්ථානවලද?

(iii) ඒ සඳහා වියදම් කල මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ඇ) මෙම කිරි අලෙවිසැල් දැනට ක්‍රියාත්මක වන්නේද?

(i) නොඑසේ නම් ඊට හේතු කවරේද?

(ii) මෙම අලෙවිසැල් මගින් නගර සභාවට ලැබී ඇති ආදායම කොපමණද?

(iii) මෙම අලෙවිසැල් ලබා දීමේදී නගර සභාව ක්‍රියාත්මක කල ක්‍රමවේදය කවරේද?

**3.** ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (පු/vi(1)/17/44)

(අ) කටාන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය කැළණිය ප්‍රාදේශීය සභාවේ වැඩ බැලීමට පත් කර ඇත්තේද?

(ආ) මෙම ලේකම්වරිය මාරු කර යවන ලෙස කිසිවෙක් පළාත් පාලන කොමසාරිස් වෙතින් ඉල්ලා ඇත්තේද?

(ඇ) සේවයට පැමිණි දින සිට මෙම ලේකම්වරියගේ සේවයේ දුර්වලකමක් හෝ අඩුපාඩුවක් වාර්තා වී ඇත්තේද?

(ඈ) රාජ්‍ය රෙගුලාසි අනුව පත්ව එන ලේකම්වරයෙකුට හෝ ලේකම්වරියකට එක් සේවා ස්ථානයක වසර කීයක් සේවය කළ හැකිද?

(ඉ) කටාන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරියට එම පත්වීම දී ඇත්තේ කවදාද?

(ඊ) එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරියගේ කාල සීමාව අවසන්ව නොමැත්තේනම් ඇය මාරු කර හැරීමට පදනමක් ඇද්ද?

**4.** ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (පු/vi(1)/17/45)

(අ) හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ "සේවා පියස" නමින් ඉදි කර ඇති ගොඩනැගිලි ගණන කොපමණද?

(ආ) එම එක් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැයකර ඇති මුදල වෙන් වෙන් වශයෙන් මෙම ගරු සභාවට ඉදිරිපත් කළ හැකිද?

(ඇ) එම ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කර භාර දී ඇත්තේ කිනම් වර්ෂයකද?

(ඈ) එම ගොඩනැගිලි අතරින් මෙතෙක් භාවිතයට ගෙන නොමැති ගොඩනැගිලි තිබේද? එම ගණන කොපමණද?

(ඉ) එම ගොඩනැගිලි වල අඩුපාඩුකම් රාශියක් ඇති බව ඔබතුමා දන්නේද?

(ඊ) එම අඩුපාඩුකම් පිළිබඳව සහ එම අඩුපාඩු නිවැරදි කිරීමට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

IX. සභාවේ කටයුතු - I

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව :

අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය.

## සභාවේ කටයුතු - II

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව : "

2017 – 04 -25 දින පළාත් සභා රැස්වීමේ දී නිවේදනය කරන ලද 2017.02.07 දින සභා සම්මත "2017 අංක 01 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය" සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ (2) ව්‍යවස්ථාව යටතේ, එතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දන්වා එවනු ලැබූ, අංක GOS/ADM/4/8/69 දරන හා 2017.04.07 දිනැති පණිවිඩය, මගින් නිර්දේශ කරනු ලබන සංශෝධන ඉදිරිපත් කිරීමේ යෝග්‍යතාවය බස්නාහිර පළාතේ පළාත් සභාවේ දී නැවත සලකා බලන ලෙස දන්වා ඇති හෙයින් හා ඊට අනුගතව ඒ පිළිබඳව ලද ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවේ අදහස් කෙරෙහි ද සැලකිලිමත්ව, 2017.04.26 දින සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී තීරණය වූ පරිදි කටයුතු කිරීමට අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයේ අංක 01 හි සඳහන් එම වැඩ කටයුතු සඳහා කාර්යය පටිපාටි රීති අංක 57 (1), 57 (3) හා 57 (4) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිම හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කිරීමට මෙම පළාත් සභාව එකඟ වෙයි."

## X . පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා :

"ගෝලීයකරණය වූ ලෝකයක ඒකීය රටක් තුළ ජාත්‍යන්තර සබඳතා ඇතිකර ගනිමින් ර අනාගතය සුරක්ෂිත කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, එ යහපාලන රජයක් බිහිකරමින් රටේ ජනතාව වෙනුවෙන් ඉටුකරණ මෙහෙවරට බස්නා පළාතේ පළාත් සභාව සිය ස්තුතිය පලකර සිටියි.'

[යෝ/ VI(I)/15/ (

2017.03.21 දින පැවති සභා රැස්වීමේ වැඩ කටයුතු සම්බන්ධිතයි.

02. ගරු පී.බී. අබේරත්න මන්ත්‍රීතුමා

"කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, 'රත්මලේ' ග්‍රාම නිළධාරී වසමේ පිහිටා ඇති 'තඹදොල ඇල්ල' දෙස් විදෙස් සංචාරකයින් නිතර ගැවසෙන, ඉතාමත් සුන්දර පරිසරයක් තිබෙන, අලංකාර දිය ඇල්ලකි.

මෙම ස්ථානයේ සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සලසමින් සංවර්ධනය කර, බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය යටතේ, පවත්වා ගෙන යා යුතු යැයි, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/vi(1)/16/04)

03. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා;

"බස්නාහිර පළාත තුළ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) වලට අනුමත විධිමත් නොවන පරිදි පවත්වා ගෙන යනු ලබන පෙර පාසැල් විධිමත් කර ලියාපදිංචි කිරීම මේ සම්බන්ධව විශේෂඥ දැනුම ඇති විධිමත් උපදේශක කමිටුවක් පත් කිරීමද, ලියාපදිංචි පෙර පාසල් ගුරු භවතුන්ට මාසිකව රු. 5000/- ක දීමනාවක් ගෙවීමට යුදුසු පියවර ගැනීම මැනවැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/vi(1)/17/01)

## XI . පොදු කටයුතු

01. ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා (බ.ප);

යෝජනාව :

'2017 අංක 01 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය.

"2017 අංක 01 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය' සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ (2) අනු ව්‍යවස්ථාව අනුව, ගරු ආණ්ඩුකාරතුමා විසින් එවන ලද අංක GOS/ADM/4/8/69 දරන 2017/04/07 දිනැති පණිවිඩය කෙරෙහි සැලකිල්ල ඇතිව ප්‍රඥප්තිය නැවත සළකා බලා සංශෝධන සහිතව හෝ රහිතව එම ප්‍රඥප්තිය සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමතය සඳහා එතුමා වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ක්‍රියා කළ යුතුය."

02. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය;

---

'බස්නාහිර පළාතේ 2017 අංක -------------- දරන පළාත් පාලන ආයතන බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රඥප්තිය'

[පළමුවර කියැවීම]

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක පළාත් පාලන ආයතනයන්හි කර්තව්‍ය සඳහා හේතු වන කවර හෝ සංවර්ධන කාර්යයක් සඳහා සූදානම් කෙරෙන ඉඩම සහ ඉඩම් අනුබෙදුම් සඳහා සැලසුම්, සියළු ඉදිකිරීම් සැලසුම් පරීක්ෂා කිරීම ද ,ඊට අදාලව නියමයන් කිරීම ඇතුළු එම සැලසුම් අනුමත කිරීම ද ඒ සඳහා නිවාස හා නගර සංවර්ධන ආඥා පනතෙහි විධිවිධාන හා නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතෙහි විධිවිධාන බලපැවැත්වීම සඳහා ද,ඊට අනුශාංගික කරුණු සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත බලතල නිශ්චිත කිරීම සඳහා ද,විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 23 වන වගන්තියෙහි (1), (2),(3) හා (4) වන උපවගන්තීන්ට ද අනනුකූල වේ.

## XII . සභාව කල් තැබීම

2017.04.26 දින .
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පරියන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව